# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

**2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ අමාත්‍යතුමිය විසින්
2018 අප්‍රේල් මස 03 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 මාර්තු මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[238 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : 2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම පිණිස හිමිකම් ඇති තැනැත්තන්ට එසේ ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි කාලසීමාව දීර්ඝ කරනු පිණිස එම පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

# කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

එල්. ඩී.— ඕ. 39/2017

**2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2018 අංක දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2016 අංක 5 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** 2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි "මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසු වසර දෙකක් තුළ" යන වචන වෙනුවට "මේ පනත ක්‍රියාත්මක වන දින සිට වසර හතරක් තුළ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ පැති සටහනෙහි "මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට වසර දෙකක් තුළ" යන වචන වෙනුවට "මේ පනත ක්‍රියාත්මක වන දින සිට වසර හතරක් තුළ" යන වචන ආදේශ කිරීමෙන්.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.